# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,016 - 2017 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2017.04.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 802 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - (i) අපරාධ වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2017 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2017 අප්‍රේල් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මැයි මස 12 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* *www.documents.gov.lk* *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## ජා ඇල ප්‍රාදේශීය සභාව - කදාන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, ජා ඇල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

උපලේඛනය

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | වැඩ ක්ෂේත්‍ර පරිපාලක III ශ්‍රේණිය | 01 | MN - 1-2016<br>රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 | ***සීමිත අයදුම්කරුවන් සඳහා :*** |

*අධ්‍යාපන සුදුසුකම් -*

අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. (මින් විෂයයන් පහක්(05)ක් එකවර සමත් වී තිබිය යුතුය.)

*පළපුරුද්ද :*

පළාත් පාලන ආයතනයක PL - 1 හා PL -2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන, සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහක් (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය.

*කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

පහත පරිදි පවත්වනු ලබන ලිඛිත විභාගයක ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබා ගන්නා අය පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

| විෂය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය (පැය 01) | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම (පැය 01) | 100 | 40% |

*විෂය නිර්දේශය :*

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය

ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක,සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|

හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම :

පළාත් පාලන අණපනත් මගින් ඒ ඒ පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී කර්මාන්ත අංශයෙන් සිදු කෙරෙන කටයුතුවල දී මාර්ග එළිකිරීම, කාණු පද්ධති සකස් කිරීම, පෙර මිශ්‍රණ එළීම හා මාර්ග නඩත්තු කටයුතුවල යොදවා ඇති සේවකයින්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය හා පාලනය, පැමිණීම හා නිවාඩු ලබා ගැනීම් කටයුතු කරන ආකාරය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙන ශීර්ෂ | උපරිම ලකුණු | සලකා බලන අවම ලකුණු |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය. (අමතර සේවා කාලය සඳහා වසරකට ලකුණු 03 බැගින්) | 15 | 50% |
| වැඩබැලීම හෝ රාජකාරි ඉටු කිරීම (පරිපාලක තනතුරක විධිමත් පත්වීම් ලිපියකට වැඩ බලන/රාජකාරි ඉටු කරන ලද කාලසීමාව සඳහා වසරකට ලකුණු 02 බැගින්) | 10 | |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම (ක්ෂේත්‍රයට අදාළව ලබා දෙන සරල ගැටළුවක් අනිවාර්යය ප්‍රශ්නයක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.) | 20 | |
| පෞරුෂත්වය (නිලධාරියා සම්මුඛ පරීක්ෂණයට මුහුණදෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම සිදු කෙරේ) | 05 | |

* සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකිවන අවස්ථාවල දී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

***විවෘත අයදුම්කරුවන් සඳහා :***

*අධ්‍යාපන සුදුසුකම්*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන්

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|

හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

*කායික සුදුසුකම් :*

තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම් :*

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

පහත පරිදි පවත්වනු ලබන ලිඛිත විභාගයක ලකුණු ලබා ගන්නා අනුපිළිවෙල අනුව වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය (පැය 01) | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය (පැය 01) | 100 | 40% |

*විෂය නිර්දේශය :*

*අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය* .- තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම

*කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය* .- ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක,සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම මැන බැලීම අපේක්ෂා කෙරේ.

02. විදුලි කාර්මික (ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය) — 01 — PL - 2-2016 රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450

*තනතුරට අදාළ රාජකාරී* .- සියලුම විදුලි ස්ථාපන කටයුතු, විදුලිය බෙදා හැරීම, විදුලි සේවා නඩත්තුව, විදුලි උපකරණ හා යන්ත්‍ර නඩත්තු කිරීම.

***සීමිත බඳවා ගැනීම :***

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *වෘත්තීය සුදුසුකම් :*<br><br>අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.<br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදළ ප්‍රායෝගික දැනුම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.)<br><br>(සැ.යු. .- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පිරවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩුව පුරවනු ලැබේ.<br><br>***විවෘත බඳවා ගැනීම :***<br><br>*අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>අදළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, සාමාන්‍ය දැනීම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබාදෙනු ලබයි.) |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය (මාසික)* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|---|
| 03 | මෝටර් කාර්මික (ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය) | 01 | PL - 2-2016<br>රු. 25,250 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,450 | *තනතුරට අදාල රාජකාරි :* පෙට්‍රල්/ඩීසල් වාහන හා යන්ත්‍ර සූත්‍රවල දෝෂ හඳුනා ගැනීම, යන්ත්‍ර සූත්‍ර හා වාහන අළුත්වැඩියා කිරීම හා නඩත්තුව. |

***සීමිත බඳවා ගැනීම :***

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)

*වෘත්තීය සුදුසුකම් :*

අදල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)

*පළපුරුද්ද:*

පළාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරක සේවය ස්ථිර කර ඇති සක්‍රිය හා සතුටුදයක සේවා කාලය වසර 05ක් සපුරා ඇති සේවකයෙකු විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ මත බඳවා ගැනීම් සිදු කෙරේ.
(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, තනතුරට අදල ප්‍රායෝගික දැනුම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.)

(සැ.යු. : සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩුව පිරවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩුව පුරවනු ලැබේ.

***විවෘත බඳවා ගැනීම :***

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතුය.)

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *වෘත්තීය සුදුසුකම් :*<br>අදල තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදල ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)<br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවා ගැනීම් සිදු කෙරේ.<br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, සාමාන්‍ය දැනීම, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබාදෙනු ලබයි.) |
| 04 | රියැදුරු (III ශ්‍රේණිය) | 03 | PL - 3-2016<br>රු. 25,790 - 10 x 270 - 10 x 300 - 10 x 330 - 12 x 350 - රු. 38,990 | *අධ්‍යාපන සුදුසුකම්:*<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම. (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් ව තිබිය යුතුය)<br>*වෘත්තීය සුදුසුකම් :*<br>1. බර වාහන රියැදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියැදුරු බලපත්‍රයක් එනම්, ‘ඒ 1’ සහ ‘සී 1’ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ‘බී’ සහ ‘ඩී 1’ පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ ‘ඒ’ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ‘ඩී’ පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.<br>2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.<br>*පළපුරුද්ද:*<br>බලපත්‍රය ලැබීමෙන් පසු රියැදුරෙකු ලෙස අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතික මගින් සනාථ කළ යුතුය.) |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *කායික සුදුසුකම් :*<br><br>අවම උස අඩි 05 ක් විය යුතු ය.<br><br>දිවා කාලයේ සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම සිදු කෙරේ.<br><br>*වෘත්තීය පරීක්ෂණය :*<br><br>දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකුගෙන්ද සමන්විත මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය, මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම මැනීමේ පරීක්ෂණයකින් සමත්විය යුතුය. |
| 05 | මුරකරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL - 1-2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් ව තිබිය යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 06 | සුසානභූමි භාරකරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL - 1-2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් ව තිබිය යුතුය.) |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය (මාසික) | අවම සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | *බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි.) |
| 07 | පුස්තකාල සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 01 | PL - 1-2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම (එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05ක් සමත් ව තිබිය යුතුය.)<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද සලකා බලා බඳවා ගැනීම සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්, කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි. |
| 08 | සෞඛ්‍ය කම්කරු (ප්‍රාථමික ශිල්පීය නොවන III ශ්‍රේණිය) | 02 | PL - 1-2016<br>රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | *අධ්‍යාපන සුදුසුකම් :*<br><br>අවම වශයෙන් 08 ශ්‍රේණිය /09 වසර සමත් විය යුතුය.<br><br>*බඳවා ගැනීමේ ක්‍රමය :*<br><br>මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කෙරෙන අතර, එහිදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙල හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතාද සලකා බලා බඳවා ගැනීම් සිදු කෙරේ.<br><br>(ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 5 බැගින්), තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික, ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය, පෞරුෂත්වය යන ප්‍රධාන ශීර්ෂ යටතේ ලකුණු ලබා දෙනු ලබයි). |

01. *නියමිත තනතුරු සඳහා වෙනත් පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචියක් ඇත්තකු විය යුතුය.
(ii) වැඩ/ක්ෂේත්‍ර පරිපාලක හැර සෙසු තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයින්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(iii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
(iv) අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ බස්නාහිර පළාත තුළ ඕනෑම ස්ථානයක සේවය කළ හැකි මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ රජයේ, පලාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය හා අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) ඒ ඒ බඳවා ගැනීම් පටිපාටි, සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ, වෘත්තීය පරීක්ෂණ, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(ii) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2017.05.15 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ජා ඇල ප්‍රාදේශීය සභාව, කඳාන" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය.)

(iii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉදිරි කෙලවරේ අදළ තනතුර සඳහන් කර අයදුම්පත් එවිය යුතුය.

(iv) අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල **ඡායා පිටපත්** එවිය යුතුය.

*(අ)* උප්පැන්න සහතිතය;
*(ආ)* අධ්‍යාපන සහතික (අදළ පරිදි);
*(ඇ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික (අදළ පරිදි).

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :— මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජය මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්ය.

04. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ බලතල ජා ඇල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

05. අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් යථා කාලයේ දී වෘත්තීය පරීක්ෂණය/සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

06. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 අනුව වැටුප් ක්‍රම දක්වා ඇති අතර, ගෙවීම් කිරීම එකී චක්‍රලේඛයේ උපලේඛන 11 අනුව සිදු කෙරේ.
(දෙමළ, ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට සැළකිය යුතුය.)

එල්. ඒ. මංජුලා සමන්ති,
ලේකම්,
ජාඇල ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 06 වැනි දින,
ජා ඇල ප්‍රාදේශීය සභාව,
කඳාන.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ජා ඇල ප්‍රාදේශීය සභාව*

**.................................තනතුර සඳහා අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :——————————————
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————
3. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————
4. උපන් දිනය වර්ෂය:————— මාසය:————— දිනය:—————
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
6. දැනට දරන තනතුර :——————————————
7. සේවය කරන උපකාර්යාලය :——————————————
8. සිදු කරන රාජකාරි කෙටියෙන් :——————————————
9. දුරකතන අංකය :——————————————
10. අධ්‍යාපන සුදුසුකම් :——————————————
    (සහතික පිටපත් ඇමිණිය යුතුය)
11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :——————————————
    (සහතික පිටපත් ඇමිණිය යුතුය)
12. සේවා පළපුරුද්ද :——————————————
13. කිසියම් වරදකට අවවාද කිරීම ට වැඩි දඬුවමකට යටත් කර ඇත් ද ?:——————————————

මෙම අයදුම්පතෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම් ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන්වමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————

***අංශ ප්‍රධානියාගේ නිර්දේශය***

........................දින මා ඉදිරිපිට අත්සන් තැබූ........................................මයා/මිය/මෙනවිය................................උප කාර්යාලයේ/පුස්තකාලයේ සේවය කරන අතර,.............................තනතුර සඳහා සුදුසු බව නිර්දේශ කරමි.

දිනය:——————

............................
අංශ ප්‍රධානී අත්සන,
(නිල මුද්‍රාව)

04-646

## වයඹ පළාත් රාජ්‍ය සේවයේ - තනතුරු පුරප්පාඩු

### කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

වයඹ පළාතේ කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ පහත දැක්වෙන තනතුර සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.05.12 වැනි දිනට හෝ එදිනට පෙර ලේකම්, කෙබෙයිගනේ ප්‍රාදේශීය සභාව, කෙබෙයිගනේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට සහ මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/දෛනික/සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | තනතුරු ගණන | අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | රු. 24,250 - 10 x 250 - 10 x 270 10 x 300 12 x 330 - රු. 36,410 | 01 | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එක් වරකදී කවර හෝ විෂයයන් 06 ක් සමත් විය යුතුය. |

01. ඉහත සඳහන් කරන ලද තනතුර සඳහා අදාළ සුදුසුකම්වලට අමතරව පහත දැක්වෙන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වර්ෂ 03 ක කාලයක් වයඹ පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. (කොබෙයිගනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් සහතික කරනු ලබන ග්‍රාම නිලධාරී සහතිකයකින් සනාථ විය යුතුය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.05.12 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ)

(iii) අයදුම්කරු යහපත්/විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) අයදුම්කරු පරම්පරාවෙන් ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

(vi) ඉල්ලුම්පත් භාර ගැනීමේ අවසන් දිනට පූර්වාසන්න අවුරුදු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නොමැත්තාවූද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතුය.

(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයකින් තනතුරු සඳහා අයදුම් කිරීමේ දී රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල සංස්ථා සේවා සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතුය.

2. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නේය. ශ්‍රේණිගත උසස් වීමක් නම් එක් අවුරුදු 01 ක වැඩ පරීක්ෂක කාල සීමාවකට යටත් විය යුතුය.

(iii) ඉහත තනතුර යටතේ බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම සේවයේ සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත් වේ. පළාත් පාලන ආයතන වල ස්ථාන මාරු කිරීමේ බලය ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රධානියා සතුවේ. තව ද පළාත් පාලන ආයතන අතර ස්ථාන මාරු කිරීම ඒ ඒ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ එකඟතාවය මත පළාත් පාලන කොමසාරිස් විසින් සිදු කරනු ඇත. රාජකාරී වේලාව හා රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ප්‍රධානියා රජය පිළිගත් නීතිරීතිවලට යටත්ව තීරණය කළ හැකි වේ.

(v) මෙම බඳවා ගැනීම සිදු කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවලට ද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලට ද රජය හෝ පළාත් සභාවේ හෝ දෙපාර්තමේන්තුවේ නියෝගවලට ද වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලවය. ඒ අනුව ක්‍රියා කිරීමට පත්වීම් ලාභීන්ද බැඳී සිටිය යුතුය.

3. *බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයක ප්‍රතිඵල මත හෝ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයක කුසලතාවය මත සුදුසුකම් ලබන අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් සුදුස්සන් තෝරා ගැනේ.

(ii) බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයකින් හා ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැති තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ලකුණු හා සුදුසුකම් මත සුදුස්සන් තෝරා ගැනේ.

4. *අයදුම්කිරීමේ ක්‍රමය :-*

(i) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් සහතික පත්‍රවල ඡායා පිටපතක් අමුණා එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
   1. උප්පැන්න සහතිකය;
   2. ජාතික හැඳුනුම්පතේ පිටපත;
   3. මූලික අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි;
   4. වෘත්තීය හෝ පළපුරුද්ද සනාථ කෙරෙන ලියවිලි;
   5. තම පදිංචිය සනාථ කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය.

(ii) මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ බඳවා ගැනීමට නියමිත තනතුරු සංඛ්‍යාව සංශෝධනය/තීරණය කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(iv) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්පත් යොමු කරන තනතුර, ගැසට් නිවේදනයේ සඳහන් පරිදි පැහැදිලිව සටහන් කළ යුතුය. අසම්පූර්ණ හා 04 ඡේදය යටතේ සඳහන් සහිතකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආර්. පී. එන්. ජයකොඩි,
ලේකම්,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 05 වැනි දින,
කොබෙයිගනේ,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව*

***කාර්යාල කාර්ය සහායක තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. අයදුම්කරුගේ නම මුලකුරු සමඟ :——————————
02. (මුලකුරුවලින් හැඳින්වෙන නම) :——————————
03. ස්ථිර ලිපිනය:——————————
04. ජාතික හැඳුනුම්පත් අංකය:——————————
05. උපන් දිනය වර්ෂය :—————— මාසය:—————— දිනය:——————
06. අයදුම්පත් භාරගන්නා 2017.05.12 වැනි දිනට වයසඃ අවුරුදු:———— මාසඃ———— දින:————
07. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————
08. විවාහක/අවිවාහක බව:——————————
09. ජාතිය:——————————
10. ඔබ දැනටමත් කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර සේවා කාලය එම පත්වීම ස්ථිර ද/තාවකාලිකද ද/අනියම් ද/දෛනික ද/ කොන්ත්‍රාත් ද යන වග :——————————

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන් ද යන වග:——————————
12. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතුය) :——————————
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :——————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් හෝ පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————

අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම තනතුර සඳහා ඉල්ලුම් කරන................................................ මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ/(ස්ථිර/අනියම්/ආදේශක/දෛනික/කොන්ත්‍රාත්) පදනම මත.................................. කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————

ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————————
තනතුර :——————————
දෙපාර්තමේන්තුව :——————————
නිල මුද්‍රාව:——————————
දිනය:——————————

04-537

---

# පළාත් පාලන නිවේදන

## ගාල්ල මහා නගර සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ දකුණු පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 1872 හා 2014.07.18 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ නිවේදනය කරනු ලැබුවා වූ ද, දකුණු පළාතේ මහා නගර සභා බල ප්‍රදේශ තුළ පදික මාරු ස්ථාන පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා සහ මාර්ගවලට අලාභහානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව පිළිගැනීමටත්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට අදාළ විධිවිධාන ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමටත්, 2017.03.10 දින තීරණ අංක 1543 යටතේ තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

රනිල් වික්‍රමසේකර,
නාගරික කොමසාරිස්,
ගාල්ල මහා නගර සභාව.

2017 මාර්තු මස 15 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

04-450

**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව**

ගෝඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයේ 2017 වර්ෂය සඳහා මස් වෙළෙඳාම කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත ඉදිරිපත් කර ඇති බවත් එම බලපත්‍රය නිකුත් කිරීම ගැන උඩුබද්දව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත එවිය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය අංක 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

2017 ක් වූ පෙබරවාරි මස 21 වැනි දින උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

එස් ජේ. එස්. වනසිංහආරච්චි,
ලේකම්,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *වෙළෙඳාම* | *ගවමස් අලෙවි සැල* |
|---|---|---|
| එම්. එච්. එම්. රියාස් ඇතුන්ගහකොටුව, ඇතුන්ගහකොටුව | ගවමස් අලෙවිය | ඇතුන්ගහකොටුව, ඇතුන්ගහකොටුව එච්. එම්. ෆාතිමා නසීජාට අයත් ඉඩම |
| එස්. මුස්තකීම් යගම්වෙල, ඇතුන්ගහකොටුව | ගවමස් අලෙවිය | යගම්වෙල, ඇතුන්ගහකොටුව අබ්දුල් සලාම් මහතාට අයත් ඉඩම |
| රසික සුරංග | ඌරුමස් අලෙවිය | කට්ටිමහන, දුම්මලසූරිය හත්වයිස් මහතාට අයත් ඉඩම |

04-565

---

**කල්මුනේ මහා නගර සභාව**

ගෝඝාතක ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

මතු සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම් ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයට 2017 වර්ෂය තුළ මස් විකිණීමට අදාළව කටයුතු පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව කල්මුනේ මහා නගර සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස්කර මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ (272) වැනි අධිකාරය 7(2) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. ලියාගත් අලි,
නාගරික කොමසාරිස්,
කල්මුනේ මහ නගර සභාව.

2017 මාර්තු මස 16 වැනි දින,
මහා නගර සභාව,
කල්මුනේ.

**පෞද්ගලික ගව මස් වෙළෙඳ සැල්**

*ගව මස් ඇසුරුම් සහ වෙළෙඳසැල් ඃ*

| *ඉල්ලුම්කරුගේ නම* | *ස්ථානය* |
|---|---|
| වෙල්ලත්තම්බි මොහම්මඩ් අරෆාත් මහතා "හනාධි මාර්ගටින්" | අංක 168 සී, ප්‍රධාන පාර, කල්මුනේ |

*ගවමස් වෙළෙඳසැල් :*

| *ඉල්ලුම්කරුගේ නම* | *ස්ථානය* |
|---|---|
| ඉලයතම්බි ඉස්සදීන් මොහම්මදු මහතා | අලියාර් පාර, කල්මුනේකුඩි |

04-451

---

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් / මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව.
අරණායක

2017 මාර්තු මස 28 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | වාකිරිගල මොරගහවෙල කුඹුර ගොඩලියද්ද මාර්ගය |
| මාර්ගයේ ආරම්භය සහ අවසානය | : | වාකිරිගල පාසල් මාවතෙන් ආරම්භව ගොඩලියද්දෙන් අවසන් වේ. |
| ග්‍රාම සේවා වසම හා අංකය | : | අංක 16 වාකිරිගල |
| මාර්ගයේ දිග හා පළල | : | දිග - මීටර් 119, පළල - අඩි 08 |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

| | | |
|---|---|---|
| 1. එච්. ඒ. ටිකිරිබණ්ඩා මයා | - | මොරගහවෙල ඉඩම |
| 2. ශාන්ත ප්‍රේමකුමාර තිලකරත්න මයා | - | මොරගහවෙල කුඹුර |

මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම

| | | |
|---|---|---|
| 1. එච්. ඒ. රණ්බණ්ඩා මයා | - | මොරගහවෙල ඉඩම |
| 2. එච්. ඒ. පී. හෙට්ටිආරච්චි මයා | - | හපුගහමුලදෙණිය ඉඩම |
| 3. පී. ඒ. චන්ද්‍රතිලක බණ්ඩාර මයා | - | හපුගහමුලදෙණිය ඉඩම |
| 4. පී. ඒ. චන්ද්‍රතිලක බණ්ඩා මයා | - | හපුගහමුලදෙණිය ඉඩම |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2014.12.03 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 343/2014 දරන පිඹුරුපත අනුව වේ.

එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලම්තිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.


පිඹුරු අංකය: 343/2014

# වාකිරිගල මොරගහවෙල කුඹුර

# ගොඩලියද්ද මාර්ගය

යොමුව :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය

පරිමාණය 1:1000




## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බොඩ කෝරළේ එගොඩපොත සහ තනිප්පේරු පත්තුවේ වාකිරිගල ගමේ පිහිටි
මොරගහවෙල, හපුගහමුලදෙනිය සහ ගොඩලියද්ද කුඹුර
යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සදන ලද

-පිඹුර-

සත්‍ය පිටපතක් බව සහතික කරමි.
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභා
17/5/29

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර්) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0284 | 00 | 0 | 11.22 | 119 | 08 | ——— |

මායිම් පෙන්වා දුන් අය }
මායිම් බලා ගත් අය } ඉඩම් හිමිකරුවන්

2014-12-05
එච්. එම්. ආර්. ටී. කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
පින්නවල, රඹුක්කන

මනින ලද්දේ : 2014.12.03 වන දින

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව**

මුල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ඒ. ජී. නිශ්ශංක වන මම පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2016.12.31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීමට 2017.04.03 වැනි දිනැති අංක 2017/624 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්. ඒ. ජී. නිශ්ශංක,<br>
ලේකම්,<br>
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

2017 අප්‍රේල් මස 03 වැනි දින,<br>
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව සහ 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූලවන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම, 2016.12.31 දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට 2017.04.03 තීරණ අංක 2017/624 යටතේ මා විසින් තීරණය කරමි.

*උපලේඛනය I*

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදයම් වියදම් ගිණුම

| | | | 2016 | 2015 |
|---|---|---|---|---|
| 1. | **පුනරාවර්ථන ආදයම්** | | **2016** | **2015** |
| | 10 | වරිපනම් හා බදු | 3,764,210.72 | 2,128,906.84 |
| | 20 | කුලී | 29,312,919.42 | 23,608,044.23 |
| | 30 | බලපත්‍ර ගාස්තු | 1,195,658.91 | 2,230,718.78 |
| | 40 | සේවා සඳහා ගාස්තු | 54,291,615.92 | 31,135,186.75 |
| | 50 | දඩ හා වරෙන්තු ගාස්තු | 7,358,561.21 | 6,138,196.63 |
| | 60 | වෙනත් ආදයම් | 5,376,432.52 | 10,022,368.99 |
| | 70 | ආදයම් ආධාර | 58,073,618.42 | 51,956,149.05 |
| | පුනරාවර්ථන ආදයම් එකතුව | | **159,373,017.12** | **127,219,571.27** |
| 2. | **පුනරාවර්ථන වියදම්** | | | |
| | 01 | වැටුප් හා දීමනා | 56,325,634.75 | 56,397,592.11 |
| | 02 | ගමන් වියදම් | 379,466.20 | 315,567.26 |
| | 03 | සැපයුම් හා උපකරණ | 7,192,868.27 | 7,673,606.73 |
| | 04 | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 24,805,116.84 | 20,321,522.54 |
| | 05 | ප්‍රවාහන, සම්බන්ධතා හා සේවා | 7,436,676.32 | 6,807,619.75 |
| | 06 | පොලී ගෙවීම් හා ලාභාංශ | 1,547,164.57 | 1,702,177.07 |

| | | | |
|---|---|---|---|
| | 07 ආධාර මුදල්, දයක මුදල් හා සහනාධාර | 4,848,121.70 | 4,080,495.35 |
| | 08 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම පාරිතෝෂික | 234,112.03 | 107,158.68 |
| | පුනරාවර්තන වියදම් එකතුව | **102,769,160.68** | **97,405,739.49** |
| | පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ/ අඩු වූ ආදායම හා වියදම | **56,603,856.44** | **29,813,831.78** |
| 3. | **ප්‍රාග්ධන ආධාර** | | |
| | 80 මූලධන ආධාර | 66,459,574.39 | 30,559,786.17 |
| | පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදයම සහ ප්‍රාග්ධන ආදයම | **123,063,430.83** | **60,373,617.95** |
| 4. | **ප්‍රාග්ධන වියදම්** | | |
| | 09 ප්‍රාග්ධන වියදම් | 85,852,182.59 | 63,634,496.78 |
| | අතිරික්තය හෝ ඌනතාවය | 37,211,248.24 | –3,260,878.83 |

උපලේඛනය II

**පඹුවස්නුවර ප්‍රාදේශීය සභාව**

***2016.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය***

| **වත්කම්** | සටහන | **2016.12.31** | **2015.12.31** |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | – | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 205,470,763.14 | 186,948,307.34 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 07 | 4,666,088.00 | 3,825,721.28 |
| ආදයම් ණයගැතියෝ | 09 | 146,177,971.25 | 69,296,919.45 |
| සේවක ණය හා අත්තිකාරම් පෙර ගෙවුම් | 08 | 9,705,226.77 | 7,300,114.90 |
| ආයෝජන | 10 | 16,185,657.11 | 7,886,531.61 |
| මුදල් සහ මුදල් හා සමාන දේවල් | 11 | 12,544,413.16 | 6,346,719.64 |
| | | 189,279,356.29 | 94,656,006.88 |
| **මුළු වත්කම්** | | 394,750,119.43 | 281,604,314.22 |
| **හිමිකම් හා වගකීම්** | | | |
| සමුච්චිත අරමුදල හා සංචිත | 14 | 284,182,951.92 | 202,463,952.81 |
| | | 284,182,951.92 | 202,463,952.81 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| දිගු කාලීන ණය | 12 | 15,832,488.57 | 17,788,411.16 |
| ජංගම වගකීම් | 13 | 94,734,678.94 | 61,351,950.25 |
| | | 110,567,167.51 | 79,140,361.41 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | 394,750,119.43 | 281,604,314.22 |

උපලේඛනය III

**පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව**

***2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය***

| | 2016.12.31 | 2015.12.31 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය/(ඌනතාවය) | 56,603,856.44 | 29,813,831.78 |
| මුදල් නොවන අයිතමයන්ගේ වෙනස්වීම් සඳහා ගැලපීම | | |
| ක්ෂය වීම් | - | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම | 26,013,866.47 | 1,599,377.53 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | **82,617,722.91** | **31,413,209.31** |
| තොග/ණයගැති හා වෙනත් ලැබීම් (වැඩිවීම)/අඩුවීම | (88,454,227.29) | 5,390,612.80 |
| ණයහිමි හා වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම/(අඩුවීම) | 33,382,728.69 | (6,386,070.31) |
| **1. මෙහෙයුම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **27,546,224.31** | **30,417,751.80** |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| දේපළ මිලට ගැනීම්/ඉවත් කිරීම් | (18,522,455.80) | (29,373,084.71) |
| ප්‍රාග්ධන වියදම් | (67,329,726.79) | (34,261,412.07) |
| 2. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (85,852,182.59) | (63,634,496.78) |
| මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය | | |
| ප්‍රාග්ධන ලැබීම් | 66,459,574.39 | 30,559,786.17 |
| ණය ගැනීම්/(ගෙවීම්) | (1,955,922.29) | (1,789,314.09) |
| **3. මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **64,503,651.80** | **28,770,472.08** |
| වර්ෂය තුළ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **6,197,693.52** | **(4,446,272.90)** |
| 2016.01.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ | 6,346,719.64 | 10,792,992.54 |
| 2015.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන A ) | **12,544,413.16** | **6,346,719.64** |
| සටහන A : | | |
| මහජන බැංකු ජංගම ගිණුම - 163 | 12,052,953.77 | 4,799,439.71 |
| මහජන බැංකු ජංගම ගිණුම - 445 | 491,459.39 | 1,547,279.93 |
| | **12,544,413.16** | **6,346,719.64** |

04-699